# 2017 ඔබට කොහොමද?

## ජ්‍යොතිශ මතය

## ලග්න තුනකට සුබයි පහකට විපත් කරදර

**නව වසර තුළ කේන්ද්‍රීය බලපෑම් ඇති කරන ග්‍රහ මාරු දෙකක් යෙදී ඇත. ජනවාරි 26වෙනිදා සෙනසුරු වෘෂ්චික රාශියෙන් ධනු රාශියටද සැප්තැම්බර් 12වෙනිදා බ්‍රහස්පති කන්‍යා රාශියෙන් තුලා රාශියටත් වශයෙනි. කටක, කුම්භ, මීන ලග්න හිමියන්ට නව වසර සුබ ඵල උදාකරයි. වාසනාවන්ත කාලයකි. වෘෂභ, මිතුන, සිංහ, කන්‍යා, ධනු ලග්න හිමියන්ට අපලයි. ධන හානි ඇතුළු අලාභ සහ විපත් යෙදේ. සෙස්සන්ට මිශ්‍ර ඵල ගෙනදේ. වසර ආරම්භයේ යෙදෙන සෙනසුරු මාරුවෙන් වෘෂභ ලග්න හිමියන්ට අෂ්ඨම ඒරාෂ්ඨකයද ධනු ලග්න හිමියන්ට ලග්න ඒරාෂ්ඨකයද යෙදෙන බැවින් මාරක විපත් හෝ ජීවිතයේ දරුණු කඩා වැටීම්වලට මුහුණ දීමට සිදුවනු ඇත. එම තත්ත්වය නව වර්ෂයට පමණක් සීමා නොවී ඉදිරිට තවත් වර්ෂ දෙකකට ආසන්න කාලයකට බල පැවැත්වේ.**



### වෘෂභ

### ඒරාෂ්ඨක අපල

ජනවාරි මාසයෙන් පසුව සෙනසුරුගේ අෂ්ඨම ඒරාෂ්ඨකය යෙදේ. රැකියාවේ ගැටළු ඇතිවේ. මුල්‍ය දුෂ්කරතා ඇතිවේ. ඥාතීන්ට, විශේෂයෙන්ම පියාට විපත් යෙදේ. විවාහ සහකරුටද අපලයි. සිත පාලනය කර ගෙන කටයුතු නොකළ හොත් අවකල් ක්‍රියාවලට යොමුවීමෙන් අවනම්බු ලැබෙන කාලයකි. පදිංචි ස්ථානයේ වෙනසක් ඇතිවිය හැක. සමාජය ඔබට එරෙහිව නැගී සිටිනු ඇත. ගිනි බිය ඇතිවේ. ඉතාමත් ප්‍රවේශමෙන් කල්පනාකාරීව සිහි නුවණින් කටයුතු කිරීමෙන් හානි අවම කරගත හැකි වේ. රාහු මහ දශා අතුරු දශා ගත කරන අයට වසරේ මැද භාගයෙන් පසු තරමක් සහනශීලී කාලයක් උදාවේ. මිත්‍ර සමාගමය යෙදෙන අතර සතුරන් පරාජයට බලය ලැබේ. ඉඩම්, ගෙවල්, වතු-පිටි ලාභ ලැබෙන අතර කලක් තිස්සේ පැවැති කරදරයකින් නිදහස්වීමට ලැබේ. අධික රුධිර පීඩනය උෂ්ණ රෝග සහ දියවැඩියාව ඇති අයට රෝග උස්සන්න වීමෙන් සෞඛ්‍ය පිරිහීමට හේතු වේ.

**සුබ කටයුතු සඳහා බදාදා, සිකුරාදා, ඉරිදා දිනයන්ද, සුදු, ක්‍රීම්, අයිවර් වර්ණයන් ද, අංක 6 ද යොදාගන්න.**



### කටක

### ප්‍රීතිමත් කාලයක්

ආදායම් තත්ත්වය යහපත්වේ. ව්‍යාපාරික කටයුතුවලින් ලාභ ලැබෙන කාලයකි. ණය ගනුදෙනුවලින් නිදහස්වීමට හැකියාව ලැබේ. රැකියාවේ තිබුණු ගැටළු මගහැරී යයි. එහෙත් ගුරු මහ දශා අතුරු දශා ගතකරන්නේ නම් රැකියාව අහිමිවීමට හේතු යෙදේ. සතුරන් පරාජය කළ හැකිවේ. විරුද්ධ ලිංගිකයන් සමඟ ඇසුර වැඩිවේ. දියුණුව ඇතිවේ. හොඳ නම ප්‍රකට වේ. ගෘහ භාණ්ඩ, වාහන ලාභ හිමි වේ. තමන්ට හිමිවිය යුතුව තිබූ දේපලක් හිමි වේ. අතහැර දමා තිබුණු වැඩ නැවත ඇරඹීමට අවස්ථාව උදාවේ. ගමන් බිමන් අධික වන බැවින් එක් තැනක රැඳීමට නොහැකි වේ. සියලුම කාරණාවලින් ජය සතුට සහ ලාභ උරුම වන සුබදායක වසරකි. අලුත් දේ, විශේෂයෙන්ම මානව ශාස්ත්‍ර විෂයයන් ඉගෙනීමට බලය යෙදේ. නමුත් ගුරු මහදශා අතුරු දශා ගත කරන අයට මේ සුබ ඵල මේ ආකාරයෙන් නොලැබේ. පවුලේ සමඟියට, ඥාතිමිත්‍ර හිතවත්කම්වලට බාධා ඇතිවේ. හිසේ, ඇස්වල , යටි බඩේ ආබාධවලට හේතුයි. සමේ රෝග , දද, කුෂ්ට ආදියටද හේතුයි.

**සුබ කටයුතු සඳහා බදාදා සහ සෙනසුරාදා දින දෙක නුසුදුසුයි. සුදු, ක්‍රීම් වර්ණ සහ 2,7,9 අංක සුදුසුයි.**



### මේෂ

### ප්‍රියයන්ගෙන් වෙන්වීම්

මිශ්‍ර ඵල උදාකරන වසරකි. ආදායම් තත්ත්වය සුබදායක නොවේ. වැය වැඩිවීමෙන් තැන්පත් ධනයටද හානි සිදුවිය හැකිය. රැකි රක්ෂාවන්හි වෙනස්කම්, අහිමිවීම් සිදුවේ. ගුරු මහ දශා අතුරු දශා ගතකරන අයට වසරේ මැද භාගයෙන් පසුව ධන ලාභ සහ රැකියාවේ උසස්වීම්වලට හිමිකම් ලැබේ. දරුවන්ට අසනීප මෙන්ම දරුවන්ගේ දුරස්වීම් ද ඇතිවේ. දරුවන් කෙරෙහි කරුණාවෙන් ක්‍රියා කිරීම ප්‍රඥාගෝචර වේ.

ඔබටද පවුලෙන් ඈත්වී විසීමට කරුණු යෙදේ. හුදකලාවීමෙන් චිත්ත පීඩා ඇති විය හැකිය. අප්‍රකට භාවයට පත් කෙරේ. අධ්‍යාපන කටයුතුවලට බාධක යෙදේ. වසරේ අග භාගයේදී හදිසි අනතුරුවලට ලක්විය හැකිය. එහෙත් තත්ත්වයෙන් උසස්වීම් සහ ප්‍රීති සමාගම් ඇතිවේ. විරුද්ධ ලිංගිකයන්ගෙන් විශේෂ ලාභ ප්‍රයෝජන ලැබීමට නියමයි. දුර බැහැර වෙහෙස කර ගමන් යෙදේ. ගුරු මහ දශා අතුරු දශා ගත කරන අයට යහපත් විවාහය යෙදේ. උසස් අයගේ උදව් උපකාර ලැබේ.

**සුබ කටයුතු සඳහා ඉරිදා, අඟහරුවාදා, සෙනසුරාදා දිනයන්ද රතු සහ නිල් වර්ණයන් ද 1,2,4,5,7,9 අංකයන්ද යොදාගන්න.**



### මිථුන

### ධන හානි

ධන හානි, දේපල හානි යෙදේ. රැකි රක්ෂා අහිමිවීම් වෙළඳ ව්‍යාපාරවලින් පාඩු යෙදේ. කරදර සහ වෙහෙසකාරී දුර ගමන් යෙදේ. කායික මානසික පීඩා හේතුවෙන් මානසික ආතතියට ලක්වීමට හේතුයි. ප්‍රසිද්ධ සතුරන් ඇතිවේ. නඩු හබවලින් පරාජයට පත්වේ. මිල මුදල් සම්බන්ධ කාරණාවලදී අතිශය ප්‍රවේශම්කාරී නොවුණොත් බලවත් කරදරවලට පත්වීමට හේතු යෙදේ.

දුර්වල හෝ පහත් අයගේ ඇසුර යෙදේ. වැරදි කතාවෙන් ආරවුල් ඇති වීමට නියමයි. සතුරන්ගෙන් පරාජයට පත් වේ. කරගෙන ආ කටයුතු අතර මග නවතී. හිතුවක්කාර විවාහයක් සිදුවිය හැකිය. සහකරුගේ පාර්ශ්වයේ ඥාතීන්ගේ කරදර විඳීමට සිදුවේ. එහෙත් අධ්‍යාපන කටයුතුවලින් ජයග්‍රහණ ලැබේ. අලුත් දේ ඉගෙනීමට අවස්ථාව ලැබේ. ශරීර ශක්තිය අඩුවේ. තුන්දොස් කෝප රෝගද ලිංගාබාධ ද ඇතිවිය හැකිය.

**සුබ කටයුතු සඳහා බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා දිනයන්ද කොළ සහ කහ වර්ණයන්ද 3 සහ 5 අංකයන්ද යොදාගන්න.**



### සිංහ

### බිය, සැක, චිත්ත පීඩා

ආදායම් මාර්ගවලට බාධා යෙදීම් සහ ධන හානියට හේතුවන වසරක් බැවින් එතරම් යහපත් නොවේ. ගුරු මහ දශා අතුරු දශා ගතකරන අයට විදේශ රැකියා අවස්ථා ලැබීමට හේතු වුවද සෙසු අයට රැකියා අහිමිවීම්, තනතුරුවලින් පහත වැටීම් නියමයි. මනුෂ්‍ය මෙන්ම අමනුෂ්‍ය බිය ඇති වේ. නිවෙසේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය තත්වය පිරිහේ. බොරු චෝදනා, අපවාදවලට ලක්වීමෙන් අවනම්බු විඳීමට සිදුවේ. පවුලෙන් වෙන්වීමට සිදුවිය හැකිය. නිතර කණගාටුව සහ සිත් තැවුල් ගෙන දීමට නියමයි. හිතවත් ඥාතියෙකුට හෝ මිත්‍රයෙකුට මාරක අපල යෙදේ. ඔබටද හදිසි අනතුරුවලට හේතුයි. එහෙත් දරු ලාභයකට හිමිකම් පෙන්වයි.

පහසුවෙන් බේරාගත හැකිව තිබුණු ආරවුල් වැඩි වර්ධනය වේ. ඇවිදිලි අධික වේ. සුලු දේ ලොකුවට සලකා කටයුතු කිරීමෙන් නැති කරදර ඇති වේ. ගුරු මහ දශා අතුරු දශා ගතකරන අයට වසරේ මුල් භාගය මෙකී අපල අත් නොවේ. සුබ ඵල යෙදේ. විභාග ජය, අලුත් දේ ඉගෙනීමට අවස්ථා උදාවේ. චිත්ත ධර්ම විෂයයන් අධ්‍යනයට මනා කාලයකි.